# මිලේච්ඡත්වයට අනුමැතියක්

සබරගමුව සහ උතුරුමැද පලාත්වල මැතිවරණ ප්‍රතිපලය පෙන්නුම් කරන්නේ සමස්ථ සමාජයම මේ පවතින පාදඩ, මිලේච්ඡ ආණ්ඩුව නැවත තහවුරු කර ඇති බවයි. ඇයි මේ තරමට ලාංකීය ජන සමාජය මිලේච්ඡත්වය අනුමත කළේ? යන්න අද රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගයන සැමගේ ප්‍රශ්නය වී ඇති බව පෙනේ.

2008 වර්ෂය අරගලයන්ගෙන් ගහන වර්ෂයක් විය. කම්කරු පංතිය තම අයිතිවාසිකම් ඉල්ලා ගෙන වැඩ වර්ජනයන්ට අවතීර්ණ වෙමින් පැවතුනි. ජනමාධ්‍යකරුවන් තම නිදහස තහවුරු කර ගැනීමට සහ මර්ධනය සහ පහරදීම් වලට විරුද්ධව වීදි බැස උද්ඝෝෂණ මෙහෙයවමින් තිබුණි. ශිෂ්‍යයන් තම අයිතිවාසිකම් වෙනුවෙන් කළා වූ උද්ඝෝෂණ ඉතා සාර්ථක විය. ගොවියන් වී විකුණා ගැනීමට බැරි වීම නිසා සහ ධීවරයන් ඉන්දන මිල වැඩි වීම පිළිබඳ ප්‍රශ්න මත උද්ඝෝෂණයේ යෙදුනේය. වතු කම්කරුවන් ගේ දෛනික වැටුප වැඩි කරන ලෙස ඉල්ලා ඔවුන් කරන අරගලය ඉතා දරුණු තත්ත්වයන්ට පරිවර්තනය වෙමින් පැවැතුනි. ඒ සමගම අතුරුදහන් වීම් සහ අනීතික අත් අඩංගුවට ගැනීම්, ඇතුළු බරපතල මානව හිමිකම් කඩවීම්වලට විරුද්ධව උද්ඝෝෂණ පෙළගැසීම සිදුවිය. මේ උද්ඝෝෂණයන්ගේ මූලික කේන්ද්‍රය වූයේ යුද්ධයේ අසාර බලපෑම සමාජ ව්‍යුහයේ දස දෙසටම පැතිර යෑමයි.

යුද්ධයට විරුද්ධව උද්ඝෝෂණයන් පැවතියත් ඒ පිළිබඳව මෙම මැතිවරණය තුළ හඬ නැගුවේ වාමාංශික පෙරමුණ පමණි. අනෙකුත් විපක්ෂය එජාපය හා ජවිපෙය යුද්ධය හරියට කළ යුතුයි සහ යුධ ජයග්‍රහණය වැදගත්ම සාධකයක්ය යන මතය මැතිවරණ වේදිකාවක් වේදිකාවක් පාසා පැවසීම නිසා යුද්ධයට එරෙහි ජනමතයට වඩා යුද්ධයයේ ජයග්‍රාහී නිමාව දකීම ජනමතයේ තීරණාත්මක සාධකය වීම අරුමයක් නොවන්නේ ඒ නිසාය. මැතිවරණය සමඟ ප්‍රාදේශීය ප්‍රශ්න සහ දූෂණ තුරුම්පුවක් ලෙස භාවිතා කරගෙන එජාප හා ජවිපෙ තම ප්‍රචාරක කටයුතු කෙතරම් තදින් ගෙන ගියද එයට ජනතාවගේ බහුතර අවධානයක් ලබා ගත නොහැකි වූයේ සමාජ ප්‍රශ්නවලට වඩා විමුක්ති කොටි සංවිධානය යුධමය වශයෙන් පරාජය කිරීම ප්‍රාථමික අවශ්‍යතාවක් ලෙස පක්ෂ-විපක්ෂ නායකයන් අතිමහත් බහුතරය විවෘතවම පිළිගෙන තිබුණ නිසාය. ඒ නිසා 2008 වර්ෂයේ උද්ඝෝෂණ සියල්ල බඩු මිල, මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, වැනි සමාජ ප්‍රශ්න සියල්ල අමතක කර පාදඩ, මිලේච්ඡ යුධවාදී ගමන් මග අනුමත කිරීම අද්භූතයක් නොවන්නේය. මේ අනුමත කළේ මර්වින් සිල්වා වැනි පාදඩ දේශපාලනඥයන්ව ය. විප්ලවකාරී යුගයක් කරා පරිවර්තනය වෙමින් පැවති 2008 වර්ෂය එක වරම මේ මැතිවරණය මගින් ප්‍රතිවිප්ලවකාරී තත්ත්වයක් දක්වා වර්ධනය වීම තේරුම් ගත හැක්කේ එසේය.

මේ ප්‍රතිවිප්ලවකාරී තත්ත්වය කොතරම් නරුමද යත් මැතිවරණයෙන් පසුව පොලිස්පති ජයන්ත වික්‍රමරත්නගේ ප්‍රකාශය දෙස බැලීමෙන් අවබෝධ කරගත හැක. "පොලිසියට එරෙහිව නැගූ අවලාද නිශ්ඵල උනා" යැයි ඔහු පවසා ඇත. මැතිවරණයට පෙර විවිධ අවලාද නැගූ පාර්ශවයන්ම ඔවුන් විසින් එල්ල කරන ලද අවලාද නිශ්ඵල ඒවා බව උසස් මට්ටමේ රාජකාරීන් තුළින් පොලිස් නිලධාරීන් පෙන්නුම් කර ඇතැයි පොලිස්පති ජයන්ත වික්‍රමරත්න පවසන්නේ අතිමහත් මැතිවරණ නීති කඩකිරීම්, ගිනිතැබීම් මධ්‍යයේය. ඒ නයින් බලන කළ මේ මැතිවරණ ප්‍රතිපල අද රාජ්‍ය ආයතනවල උසස් නිලධාරීන් හට පවතින දූෂණ, මිනීමැරුම්, පාතාල වැඩ සාධාරණීකරණය කරීමට මගක් වී ඇති සේය. එමෙන්ම නීති සහ අණපනත් වෙනස් කරමින් විවිධ පුද්ගලයන් අත්අඩංගුවට ගනිමින් ගෙනියන ක්‍රියාදාමයක් දක්වා වර්ධනය වී ඇත. ඒ මගින් නුදුරු කාලයේදීම විශේෂයෙන් යුධ විරෝධීන් වෙත හා සටන්කාමී වෘත්තීය සමිති ක්‍රියාධරයන් වෙත විශාල මර්ධනයක් ගෙන ඒමට ආණ්ඩුව ක්‍රියා කරන බව පෙන්නුම් කරමින් පවතී.

මෙම ක්‍රියාදාමය ගොඩ නැගීමේ ප්‍රධාන දායකයන් වූ ජවිපෙයත් අද අන්ත අසරණ තත්ත්වයට වැටී ඇත. ජාතිවාදය ආණ්ඩුවෙන් එළියේ සිට ඇවිස්සීමට වඩා මහින්ද රාජපක්ෂ ජාතිවාදී වී ඇත. එවිට වඩා බලසම්පන්න ජාතිවාදය ජනතාව වැළඳ ගැනීම නිසා ජවිපෙ ශක්තිය අහෝසි වෙමින් යයි.

මේ ඇතිවූ ප්‍රතිපලවල තත්ත්වය විමුක්ති කොටි සංවිධානය පරාජය කර ළඟා කර ගත යුතු යුධවාදී ප්‍රතිපත්තියේ ජයග්‍රහණයකට පාර කැපුවේ වී මුත් ඒ සඳහා ඉඩක් තිබේ ද? ජාතික විමුක්ති අරගලයන් එසේ පරාජය කළ හැකිද? කෙසේ නමුත් නැවත විමුක්ති කොටි සංවිධානය විශාල ප්‍රහාරයන් කරා ළඟා වෙමින් එන බව පෙන්නුම් කිරීමට සාධක මැතිවරණයෙන් පසුව දකගත හැක. ආණ්ඩුවේ කයිවාරුව අවසන් වන්නේ තරමක් දුරට ලොකු ප්‍රහාරයක් එල්ල වුවහොත් ඇතිවන තත්ත්වයකින්ය.

මැතිවරණ ප්‍රතිඵලවලින් පසුව ලංකාවේ ඊනියා සාම ඒජන්තවරු වන වික්ටර් අයිවන්, කුමාර් රූපසිංහ. ජෙහාන් පෙරේරා වැනි අය විමුක්ති කොටි සංවිධානය පරාජය කිරීම අනිවාර්ය බව පවසයි. මෙවන් කවටයින්ගේ මුසාවාද ජාතික විමුක්ති ව්‍යාපාරයක කාර්යභාරයවත් නොසලකා කරන වහසි බස් බව අමතක නොකළ යුතුය. ඒ වගේම අද ලංකාවේ යුද්ධයට විරුද්ධව සහ බලය බෙදාහැරීමට එකහව ඉන්නා පිරිස තව තවත් කුඩා වී තිබීම ද මේ කථා තුළින් පෙනේ.

මේ තත්ත්වය හමුවේ අප ඉදිරියේ දී කළ යුතු කාර්යභාරය අති විශාලය. මර්ධනයට විරුද්ධව වගේම යුද්ධයට විරුද්ධව ප්‍රජාතන්ත්‍රවාදය රැකගැනීම සඳහා සමාජය තුළ විශාල කාර්භාරයක් පැවරී ඇත. ඒ සඳහා මේ අදහස්වලට එකහ අයගෙන් සැදුම්ලත් සංවිධාන ව්‍යුහයක් සකසා මුහුණ දීම අද පටන්ම ඇරඹිය යුතුව ඇත.

**චමිල් ජයනෙත්ති**